මෙම කොටස සඳහා වෙනම පිළිතුරු පොතක් භාවිත කළ යුතුය. එහි විෂය ලෙස ලිවිය යුත්තේ **"කළමනාකරණය"** යන්න පමණි.

සියලු ම හිමිකම් ඇවිරිණි

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

**අන්තර්මධ්‍ය විභාගය - 2011 ජූලි**

(56) ව්‍යාපාර නීතිය හා කළමනාකරණය

විෂයයේ

**කළමනාකරණය**

Management

2011-07-31
පෙරවරු
[10.30 – 12.00]

**කාලය: පැය 1 විනාඩි 30 යි.**

පිටු ගණන: 02
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්:**

  *(1) මෙම ප්‍රශ්න පත්‍රය - **ව්‍යාපාර නීතිය හා කළමනාකරණය** යන විෂයයේ **කළමනාකරණය** කොටස යි.*

  ***(2) ඕනෑම ප්‍රශ්න පහක (05) ට උත්තර ලියන්න.***

  *(3) විභාගයට අයදුම් කළ භාෂා මාධ්‍යයෙන්, සපයා ඇති පිළිතුරු පොත්වල උත්තර ලිවිය යුතු ය.*

  *(4) ව්‍යාපාර නීතිය හා කළමනාකරණය විෂයය සමත් වීම සඳහා අයදුම්කරුවකු, ව්‍යාපාර නීතිය හා කළමනාකරණය යන එක් එක් කොටසට, අවස්ථාවෝචිත පරිදි, 40% හෝ 50% බැගින් වූ අවම ලකුණු මට්ටමක් ලබාගත යුතු ය.*

  *(5) ලකුණු 50.*

---

**01.** (a) "ව්‍යාපාරය" යන පදය විස්තර කරන්න. (ලකුණු 02)

(b) ව්‍යාපාරයක ආර්ථික අරමුණු (economic objectives) සහ සාමාජීය අරමුණු (social objectives) අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

(c) "රජයට අයිති සහ පාලනය කරනු ලබන ව්‍යාපාර සැමවිටම සමාජ සුබ සාධනය සඳහා නැඹුරු වූවකි".

ඔබ මෙම ප්‍රකාශය සමග එකඟ වන්නේද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

**02.** (a) "කළමනාකරණය" යන පදය නිර්වචනය කරන්න. (ලකුණු 02)

(b) කළමනාකරණය අවශ්‍ය වන්නේ ඇයි? හේතුන් දෙකක්(02) සඳහන් කරන්න. (ලකුණු 02)

(c) කාට්ස් සහ කාන් (Katz and Kahn) විසින් හඳුන්වා දෙනු ලැබූ කළමනාකරණ කුසලතාවයන් තුනක්(03) පැහැදිලි කරන්න. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

**03.** (a) "මානව සම්පත් කළමනාකරණය" යන්න නිර්වචනය කරන්න. (ලකුණු 02)

(b) "බඳවා ගැනීම" (Recruitment) සහ "තෝරා ගැනීම" (Selection) අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

(c) සැලසුම්කරණය සංවිධානයකට වැදගත් වන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

**04.** (a) "අධිකාරිය" (Authority) සහ "වගකීම" (Responsibility) අතර වෙනස පැහැදිලි කරන්න.
(ලකුණු 04)

(b) අධිකාරිය පැවරීමට හේතු වන කාරණා දෙකක්(02) පැහැදිලි කරන්න. (ලකුණු 02)

(c) විමධ්‍යගතකරණයේ (decentralization) වාසි සහ අවාසි පැහැදිලි කරන්න. (ලකුණු 04)
(මුළු ලකුණු 10)

**05.** (a) "අවශ්‍යතා" (Needs) "වුවමනාවන්ගෙන්" (Wants) වෙන්කොට දක්වන්න. (ලකුණු 02)

(b) "අලෙවිකරණය" යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 02)

(c) "වෙළෙඳපොල ඛණ්ඩනය" (Market Segmentation) සහ "වෙළෙඳපොල ඉලක්කකරණය" (Market Targeting) යන පද පැහැදිලි කරන්න. (ලකුණු 06)
(මුළු ලකුණු 10)

**06.** (a) කළමනාකරණ කාර්යයක් හැටියට "පාලනය" (Controlling) යන්න නිර්වචනය කරන්න.
(ලකුණු 02)

(b) "පූර්ව පෝෂණ පාලනය" (Feedforward Control) සහ "පසුපෝෂණ පාලනය" (Feedback Control) අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

(c) සාර්ථක පාලන පද්ධතියක දක්නට ලැබෙන ගුණාංග හතරක්(04) පැහැදිලි කරන්න.
(ලකුණු 04)
(මුළු ලකුණු 10)

- o0o -